**චමින්ද නාගහවත්ත එ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

RTIC Appeal ( පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 478/2018 (2018.12.04 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යා පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යා පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - චමින්ද නාගහවත්ත , නීතිඥ
**නොතිසි ලත් පාර්ශවය** - කොමසාරිස්තුමිය, **මානව හිමිකම් කොමිෂන් සභාව**

**පෙනීසිටීම**
අභියාචක - පැමිණ නැත
පොදු අධිකාරිය - ඩබ්ලිව්.ඒ.යු .එස් විජේසූරිය , ප්‍රලේඛන නිලධාරියා (Documentation Officer), **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
ඒ.එස් . නිලන්ත , විමර්ශන නිලධාරියා , **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.02.16 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.03.12 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.03.21 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.05.10 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.02.16 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. පැමිණිලි අංක HRC/K/09/18-W දරණ පැමිණිල්ලේ පිටපත,
2. ඉහත සඳහන් පැමිණිල්ල සමග ඉදිරිපත් කරන ලද අනෙකුත් ලේඛන සහ අදාළ ගොනුවෙහි සියළු ඇමුණුම්,
3. ඉහත සඳහන් පැමිණිල්ල සම්බන්ධයෙන් 2018.01.18 වන දින සහභාගිවූ පැමිණිලිකරුවන්ගේ සහ වගඋත්තරකරුවන්ගේ අත්සන් සහිත නාම ලේඛනය සහ ඔවුන්ගේ ලිපිනයන් සඳහන් ලේඛනයක් තිබේනම් එහි පිටපත,
4. ඉහත සඳහන් පැමිණිල්ලේ විමර්ශන නිලධාරිනිය වූ එච්. කේ. විතාන මහත්මියගේ පදිංචි ස්ථිර සහ තාවකාලික ලිපිනයන්,
5. අභියාචක විසින් 2018.01.19 වන දින අදාළ විමර්ශන නිලධාරිනියගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන පැමිණිල්ල සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග,
6. පැමිණිලි අංක HRC/K/09/18-W දරණ පැමිණිල්ල විමර්ශනය කිරීමෙන් අනතුරුව ඉහත විමර්ශන නිලධාරිනිය විසින් දෙනු ලැබූ නිරීක්ෂණ වාර්තාවේ පිටපත,
7. ඉහත සඳහන් එච්. කේ. විතාන මහත්මිය විසින් අදාළ විමර්ශන කටයුත්ත ආරම්භ කිරීමට පෙර කොමිෂන් සභාවෙහි නියෝගයක් මත විමර්ශන සඳහා නීතිඥවරයෙකුට පෙනී සිටීමට නොහැකි බවට සඳහන් යම් නියෝගයෙහි පිටපතක් හෝ එම නීතිමය ප්‍රතිපාදනය සඳහන් ලියවිල්ලෙහි පිටපතක් සහ
8. මධ්‍යම පළාත් සභාවේ සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සිසුන්ගේ යහපත සඳහා ගනු ලබන තීරණයක් අභිබවා යමින් කිසිදු ලේඛනයක් හෝ ස්ථාන පරීක්ෂනයකින් තොරව හුදු එක් පැමිණිල්ලක් මත මානව අයිතිවාසිකම් කඩවීමක් ලෙස අදාළ නිලධාරිනිය තීරණය කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන වගන්තියේ සඳහන් ප්‍රතිපදනයකට අනුවද?

තොරතුරු නිලධාරියා 2018.03.12 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාණ්ඩලික තීරණ අනුව විමර්ශන ගොනු හා සම්බන්ධ තොරතුරු නිකුත් කරනු ලබන්නේ එම පැමණිලි වලට අදාළ පාර්ශවකරුවන්හට පමණි. නමුත් අභියාචක වන ඔබ මෙම පැමිණිල්ලේ විමර්ශනයට සහභාගී වී ඇත්තේ එම විද්‍යාලයේ ආදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් පමණක් බවත් ඒ අනුව මෙම පැමණිල්ල හා සෘජු සම්බන්ධතාවයක් නොමැති බවත් නිරීක්ෂණය වන බවත් එසේම මානව හිමිකම් කොමිෂන් සභා පනතේ වගන්ති 26 (1) ප්‍රකාරව කොමිෂන් සභාවේ නිලධාරියෙකු විසින් කොමිෂන් සභා පනත මගින් පවරා ඇති තම බලතල ක්‍රියාවට නැංවීමට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබිය නොහැකි බව දැනුම් දෙන ලදී. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.03.21 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.05.10 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනි විසින් 2018.07.12 දිනැති ලිපිය මගින් පහත තොරතුරු තවදුරටත් දන්වන ලදී.

අභියාචකගේ අභියාචනය ප්‍රකාරව තොරතුරු ලබා දිය හැකි ද යන්න තීරණය කිරීම සඳහා, අභියාචක මෙම පැමිණිල්ලේ පාර්ශවකරුවෙකු ද යන්න නැවත වතාවක් විමසා බැලීම උදෙසා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශිය කාර්යාලය මගින් විමසීමක් කල අතර , එහිදී පොදු අධිකාරිය වෙත යොමු කොට ඇති වාර්තාවට අනුව මූලික විමර්ශනය පැවති දින ඉදිරිපත් කල ලේඛනයේ අභියාචක විසින් අත්සන කොට ඇත්තේ ආදී ශිෂ්‍ය සංගමයේ ලේකම් ලෙස බවත් විදුහල්පතිවරයා නියෝජනය කරමින් එම මහතාගේ

නීතිඥවරයා ලෙස නොවන බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව අභියාචක පැමිණිලි පාර්ශවයක් නොවන බව තවදුරටත් නිරීක්ෂණය වන බැවින් අභියාචක විසින් ඉල්ලා සිටින්නාවූ තොරතුරු ලබා දිය නොහැකි බව ය.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

**අභියාචක පැමිණ නැත. අභියාචක 2018.11.23 දිනැති ලිපිය මගින් 2018.12.04 දින අභියාචක හට නඩු විභාග ගණනාවක් යෙදී ඇති බැවින් කොමිෂන් සභාවේ විභාග කිරීම සඳහා සහභාගී වීමට නොහැකි බව දන්වන ලදී.**

මූලික විමර්ශනය පැවති දින ඉදිරිපත් කල ලේඛනයේ අභියාචක විසින් අත්සන කොට ඇත්තේ ආදී ශිෂ්‍ය සංගමයේ ලේකම් ලෙස බවත් විදුහල්පතිවරයා නියෝජනය කරමින් එම මහතාගේ නීතිඥවරයා ලෙස නොවන බවත් නිරීක්ෂණය වුණ බවත්, ඒ අනුව අභියාචක පැමිණිලි පාර්ශවයක් නොවන බව තවදුරටත් නිරීක්ෂණය වන බැවින් අභියාචක විසින් ඉල්ලා සිටින්නාවූ තොරතුරු ලබා දිය නොහැකි බව **පොදු අධිකාරිය 2018.07.12 දිනැති ප්‍රතිචාරය නැවත අවධාරණය කළේය.**

**නියෝගය:**

**තොරතුරු නිලධාරියාට/ නම්කළ නිලධාරියාට තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 (අ) වගන්තියට යටත් වන ලෙස සහ එම නියමයන් අනුව පෙනී සිටීමට අදාල දැනුම් දීම් යවන ලෙසට නියෝග කරන ලදී.**

**15 (අ) වගන්තිය සමග කියවිය යුතු 39 (ඇ) වගන්තිය අනුව,අභියාචක හට නඩු විභාග ගණනාවක් යෙදී ඇති බැවින් කොමිෂන් සභාවේ විභාග කිරීම සඳහා සහභාගී වීමට නොහැකි බව දන්වන ලදී හුදෙක් ප්‍රකාශ කිරීමකින් තොරව ඔහු විසින් මෙම කොමිෂන් සභාවට ගොනු කර ඇති අභියාචනා විභාගයට සහභාගී වීමට අභියාචකට වගකීමක් ඇත.**

**නැවත නැවතත් අවස්ථාවන්හිදී එවැන්නක් සිදු වීම, තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ අභියාචන ක්‍රියාවලිය උල්ලංඝනය කිරීමක් විය හැකිය.**

**අභියාචකට පෙනී සිටීම සඳහා අවසන් වරට මෙම අභියාචනය සඳහන් වනු ඇත. අභියාචක කොමිෂන් සභාවේ මීලග කැඳවීම් දිනයේ පෙනී සිටීමට අපොහොසත් වුවොත් කොමිෂන් සභාව විසින් අවසන් නියෝගය නිකුත් කරනු ඇති බව කොමිෂන් සභාව අවධාරණය කරන ලදී.**

අභියාචනය කල් තබන ලදී.

මීලග කැඳවීම් දිනය: 16.01.2019

*********